# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012
### 2015 මාර්තු - මැයි

### මානවශාස්ත්‍ර පීඨය
### බෞද්ධ දර්ශනය - BUPH E 2025

### බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමායාන්තර චින්තා

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

---

01. බුද්ධකාලීන භාරතීය සමාජ තත්ත්වය පිළිබඳ හැඳින්වීමක් කොට බුදුසමය මානව සංහතියේ ඒකත්වය තහවුරු කොට ඇති ආකාරය මූලාශ්‍රය අනුසාරයෙන් පෙන්වා දෙන්න.

02. ධනෝපායනය මෙන්ම ධන පරිභෝජනය ද සදාචාරාත්මක පදනමක් මත සිදුකළ යුතු බව බෞද්ධ ඉගැන්වීම් අනුව පැහැදිලි කරන්න.

03. යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගැනීමෙහි ලා සමාජ ආචාර ධර්ම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් වලින් ලබා ගත හැකි පිටිවහල ප්‍රමාණ කරන්න.

04. ආත්මාර්ථයෙන් තොරව රාජ්‍ය පාලනය කිරීම බෞද්ධ දේශපාලන මූලධර්ම වල දැකිය හැකි විශිෂ්ඨ ලක්ෂණයක් ලෙස ඇගයීමට ලක්කරන්න.

05. වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීමෙහිලා, බුදුසමයෙන් ලැබෙන උත්තේජනය, නීතිය හා වරද හා දඬුවම පිළිබඳ බෞද්ධ ආකල්පය අනුසාරයෙන් පෙන්වා දෙන්න.

06. ගිහිපැවිදි සබඳතාව පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් උභය පක්ෂයේම යහපැවැත්ම අරමුණු කොට සකස් වී ඇති අයුරු පෙන්වා දෙන්න.

07. ආත්මවාදය යනු කුමක්දැයි පැහැදිලි කොට බුදුසමය ආත්මීය සංකල්ප බැහැර කරනුයේ කිනම් සාධක පදනම්කරගෙන දැයි පරීක්ෂා කරන්න.

08. නිවන වනාහී පාරභෞතික ලක්ෂණවලින් තොර වූ මානසික අවස්ථාවක් දැයි අදාළ මූලාශ්‍රය නයින් විමසුමට ලක්කරන්න.

09. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් බුද්ධකාලීන භාරතීය ඉගැන්වීම් වලින් වෙනස්වන අයුරු අදාළ මූලාශ්‍රය නයින් පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.
    - දා ඊශ්වර නිර්මාණවාදය
    - දාදා දශ අව්‍යාකෘත ප්‍රශ්න
    - දාදාදා පටිච්චසමුප්පාදය
    - දාඃ මෝක්ෂය පිළිබඳ ශ්‍රමණ සම්ප්‍රදායගත විවරණ

***************************